


# විතක්කනේ හැංගෙනවා



ගීතයක් ගායනා කරන ශිල්පීන් අනුව ඒ ගීයට ඇළුම් කරන රසිකයින් ඒ ශිල්පියාගේ අනන්‍යතාව හඳුනාගන්නවා. ගීත අතර තනිවම ගායනා වන ඒකල ගීත වගේ ම යුග ගීත, සමූහ ගායනා වාගේ වෙනස් ආකාරයේ එකතුවීම් අසන්නට ලැබෙනවා. ඒ ගීතවල ඒ ආකාරයට එක් වන්නේ ඒ ඒ ශිල්පීන්ගේ අනන්‍යතාවයන්.

යුග ගීත අතර ගැහැණු හා පිරිමි ශිල්පීන් ගායනා කරන ඒවා වැඩි වශයෙන් දක්නට ලැබෙනවා. එත් පිරිමි / පිරිම යුග ගායනාත් එදා ඉඳන්ම අපට කාලයෙන් කාලයට අසන්නට ලැබෙනවා. අද වන විට මව්බිමේ සිටින ප්‍රවීණතම ගායන ශිල්පීන් දෙදෙනකු වන ආචාර්ය වික්ටර් රත්නායකයන් එක්ක සුනිල් එදිරිසිංහයන් ගායනා කළ මුල්ම යුග ගීතය රචනා කරන්නට අප වරම් ලැබුවේ අහඹු සිදුවීමක් විදියට. ඒ සිදුවීම ගී "සඳළුවේ" සටහන් කරන්නට සිතුවේ ගීතයක වටපිටාව ගැන ලියන්නට යමක් අප මතකයේ ඉතිරිව ඇති නිසයි.

ආචාර්ය වික්ටර් රත්නායකයන් සමඟ කරනා නිර්මාණ ගනු-දෙනුවේදී කලින් හදලා තියෙන තනුවකට (මෙලඩි එකකට) වචන යොදන්නට වුන අවස්ථා බොහොම තිබුණා. ඇත්තටම පූර්ව නිර්මිත තනුවකට වචන යොදන ආකාරය අපට කියා දුන්නෙත් ආචාර්ය වික්ටර් රත්නායකයන්මයි. ඒ අන්දමට වචන යෙදූ තනුව නැවත ගයා පෙන්වන්නට හැකියාවක් තිබුණේ ඒ වචන මොන තරම් තනුවට ගැලපෙනවා ද කියන එක පෙන්නලා දෙන්නට පුළුවන්. අප හට යන්තමින් හෝ තනුවක් මුමුණා ගන්නට ඇති හැකියාව මුලින්ම වික්ටර් රත්නායකයන් හඳුනා ගන්නේ ඒ ආකාරයෙන්. " සිරස" ගුවන් විදුලි නාලිකාවට රත්න ශ්‍රී විජේසිංහයන් රචනා කළ "පාත ඉඳන් අපි ආවේ" ගීතයේ සමූහ ගායනාවලට හඬ පටිගත කරන වෙලාවේ ශබ්දාගාරයේ සිටි ධනංජය සෝමසිරි ප්‍රවීණ තබ්ලා වාදන ශිල්පියාටත්, ජයන්ත රත්නායක පුතණුවන්ටත් අප හටත් රත්නායකයන් ඇරයුම් කලේ.

"සංගීත ශිල්පීන්ගේ පුතාලනේ...... වෙන කාටවත් අඬගහන්න ඕන යැ" කියමින්.

ධනංජය තබ්ලාවෙන් ශිල්ප දැක්වූවත් ඔහුට සිය පියාණන් වූ අතුල සෝමසිරි ශිල්පියාණන්ගේ ගායනීය හඬ හා හැකියාවන් ලැබිලා තියෙනවා. ජයන්ත වික්ටර් රත්නායකයන්ගේ වැඩිමහල් පුතායි.

පඩියෙ කාලයට මෙල්බන් නුවරදී මේ හැකියාව උරගා බලන්නට ඇති වුණ අදහස ආචාර්ය වික්ටර් රත්නායකයන් හට අප පසු තමන් සමඟ යුග ගීයක් ගයන්නට තනුව සහ සංගීතය නිර්මාණය කරදුන් පද රචානාවයි ''විතක්කනේ හැංගෙනවා'' ගීතය.

එක පිරිමි දරුවකු සිටින පවුලකට තවත් පිරිමි දරුවෙක් එක් වන විට ඇති වන තත්වය ගැන ධනාත්මකව සිතා සාකච්ඡා කරන අපගේ පද රචනාවේ යුග ගායනයට දෙබස පිරුණේ අයියා කෙනෙකුත් මල්ලී කෙනෙකුත් අතරයි. අපගේ සිරිත් විරිත්වලට අනුව දේපළ බෙදී යාම, මහගෙදර බාලයාටය හිමිවීම වාගේ දේවල් වලට අමතරව ආදරය, අවධානය, වාගේ දෙවල් බෙදී යාම ගැනත් ධනාත්මකව සාකච්ඡා කරන්නට උත්සහ කරපු මේ පද රචනාවට අපගේ ජන ගී ආර සිහිගන්වන කඳිම තනුවකුත්, සංගීත රටාවන් රත්නායකයන් එක් කළ අප අතරින් වියෝ වුණ විජේරත්න රණතුංග තාල වාද විශාරද-යාණන්ගේ තබ්ලා පද රබන් පද උඩැක්කි පද මේ ගීතයේ රිද්මය පිරුවා. ''අයියාගේ කොටස ආචාර්ය වික්ටර් රත්නායකයන්ට ම හඬ මුසු කර අප වෙත එව්වේ අපගේ හඬ මෙල්බන් නුවරින් මුසු කරගන්නටයි.

මේ හඬ මුසු කිරීමට උපකාර වුණේ අප අතර සිටින උපා උපදාස මහත්මයයි. ඒ මහත්මයාගේ නිවසේ ඇති ශබ්දාගාරයට එදා කැමරන් කොළඹගේ සහෘදයා එක් වුණේ අප ලවා ගිය නිසියාකාරව ගායනා කරවා ගැනීමට උපදෙස් දෙන්නටය. ප්‍රියන්ත ප්‍රනාන්දු සහෘදයන් එදා අපටත් එක් වුණා.

මේ ආකාරයට ගීතයේ මල්ලීගේ කොටස් ගායනා කළත්, එය අපගේ සිතට මදි බවක් දැනුණා. ඒ නිසා ඒ මුළු ගීතය ආචාර්ය වික්ටර් රත්නායකයන් වෙත යැව්වේ රත්නායකයන්ගේ අදහස් දැනගන්නා රිසියෙන්.

ගීයක් ලෙස එළිදක්වන්නට නම් අප තවත් උත්සහ කරන්න ඕන බවයි. රත්නායකයන්ගේ අදහස වූයේ. පද රචනයටත තනු සහ සංගීත නිර්මාණයටත්, රත්නායකයන්ගේ ගායන දායකත්වයටත් සාධාරණයක් ඉටු වන්නට නම් අප ගැයූ කොටස් ප්‍රවීණයෙකු ලවා ගායනා කරවාගත යුතු බවයි අපගේ අදහස වූයේ. එසේ නොවුවහොත් අප මොන තරම් උත්සහ කළත් මෝස්තර නිර්මාණයට සාධාරණයක් ඉටු නොවන බව අප දරූ අදහසයි. ආචාර්ය වික්ටර් රත්නායකයන්ද ඒ අදහසට එකඟ වුණා.

''කවුරු ලවා ද මේ කොටස් ගායනා කරවාගන්නේ ?''

''මං හිතන්නේ සුනිල් ගැලපෙයි'' ඒ ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ අදහසයි. ඒ අනුව සුනිල් එදිරිසිංහයන්ට මලනුවන්ගේ කොටස් ගායනා කරන්නට ආරාධනා කළා. ඒ ආර-ාධනයට සුනිල් එදිරිසිංහයන් ඉතාම සතුටින් එකඟ වුණා.

''විත්තක්කනේ හැංගෙනවා ගීතයේ වටපි-ටාවයි ඒ. මේ ගීතයට ඉහළ ප්‍රතිචාර දැක්වූ රසිකයන් අතරට ගී පද රචකයෙකු වන ශ්‍රී මහා බෝධීන් වහන්සේ භාරව කටයුතු කරන රුවන්වැලි සෑ විහාරස්ථානාධිපති පූජ්‍ය ගරු පල්ලේගම හේමරතන ස්වාමීන් වහන්සේ, මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය වාගේම රසිකයින් එක් වෙනවා.

ඒ වගේම අන්තර් ජාලයේ ''එළ කිරි ඩොට් කොම්'' වාගේ ''බෙලාග්'' අඩවි වලින් මේ ගීත කතා බහට ලක් වුණ බව මතකයි. අප එදා ගත් තීරණය හරි බව මේ රසික ප්‍රතිචාරවලින් හොඳින් වැටහෙනවා. මේ නිර්මාණයට දායක වුණ ආචාර්ය වික්ටර් රත්නායකයන්ටත් සුනිල් එදිරිසිංහයන්ටත් අනේක වාරයක් ස්තූතිවන්ත වෙනවා. ඒ පද රචනයට උපරිම දායකත්වය දෙමින් රසිකය-ිනට වෙනස් අත්දැකීමක් ලබා දුන්නාටයි.

**අයියා** :
විතක්කනේ හැංගෙනවා
අම්මගේ හේමලයා
මගේ බාල ටිකිරි මලයා
**මල්ලී** :
කුරක්කනේ වෙහෙසනවා
අප්පච්චිගෙ දෙයියා
අපෙ සවිය නුඹයි අයියා

**දෙදෙනා :**
එක ලෙයකට එක කිරකින් පණ පෙවුණා
දෙන්නා
එක හිතකට එක සුසුමින් පණ පෙවුණා දෙන්නා

**අයියා** :
මව් දෙතනේ කිරි වැරණා නුඹ කුසයට ආදා
මල්ලියේ කුසගිනි නිවුනා නුඹ සුතරල් පෑදා
**මල්ලී** :
පිය උරුමේ වැට බැඳුණා මා මෙලොවය ආදා
අයියේ පැල ඉණි බිඳුණා ලෙන්ගතුකම් හන්දා

**අයියා** :
කෙළි මඩලේ හිත මුදවා සෙයිලමකට ගිය දා
මල්ලියෙ කඳුලක මැව්වා නුඹ සක්විති වන දා
**මල්ලී** :
දොර මඬලේ මල් ගන්වා නෑනන්ඩිය ආ දා
අයියේ කල එළි වූවා මහ ගේ ඈ හන්දා

**ගායනය :ආචාර්ය වික්ටර් රත්නායක**
**සහ සුනිල් එදිරිසිංහ**

**තනුව සහ සංගීතය :**
**ආචාර්ය වික්ටර් රත්නායක**
**රචනය සිසිර දිසානායක**

## සන්නස Cartoon by PK

